ශ්‍රී ලංකා ජනාධිපති

இலங்கை சனாதிபதி

**President of Sri Lanka**

## වෙසක් පණිවුඩය

සිදුහත් කුමරුගේ උපත, සම්බුද්ධත්වයට පත්වීම සහ සම්බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑම නිමිත්තෙන් ලෝකවාසී බෞද්ධ ජනතාව විසින් සමරනු ලබන වෙසක් උළෙල පසුබිමින් පරිත්‍රාණ ධර්ම දේශනයක් සේ ඇසෙනුයේ මානව ශිෂ්ටාචාරයේ පුළුල් පරාසයක් ආලෝකවත් කළ ශ්‍රේෂ්ඨ දාර්ශනිකයෙකු සහ විශිෂ්ට මානවවාදි ශාස්තෘවරයෙකුගේ උත්තුංග දැක්ම පිළිබඳ ප්‍රකාශනය වේ.

ගෞතම බුදුරජාණන් වහන්සේ පහළ වනුයේ භාරතීය සමාජය විවිධ ඇදහිලි සහ ආගම් කෙරෙන් අතිශය සංකීර්ණව පැවැති අවධියකය. බ්‍රාහ්මණ බලාධිකාරිත්වය විසින් ජනවිඥානය සිය ආධිපත්‍යයට නතුකර ගෙන පැවැතිණි. ජන සමාජය විවිධ බෙදීම් කරණයට ගොදුරුව තිබිණි. ස්ත්‍රීත්වය යනු, නිෂේධනාත්මක ජීව විශේෂයක් විය. පුරුෂාධිපත්‍යය හමුවේ ඇය අව වරප්‍රසාදිත චරිතයක් වුයේය.

ආචීර්ණ කල්පිත එකී ගතානුගතික සමාජ ආකල්ප පුපුරුවා හළ සම්බුද්ධාගමනය අන්ධානුකරණයේ ගැලී හුන් සමාජය විද්‍යාත්මක චින්තනයකට යොමු කළ අතර, මිනිසාගේ බුද්ධියට ඍජුව ආමන්ත්‍රණය කළේය. ඔහු සතු සිතා, විමසා බලා සත්‍යය තේරුම් ගැනීමේ අයිතිය ඔහුටම පැවරුවේය.

එනයින් මිථ්‍යාවෙන් අත්මිදුණු අධ්‍යාත්මික මිනිසකු සමාජගත වුයේය.

මිනිසකු වසලයෙකු හෝ ශ්‍රේෂ්ඨයෙකු වන්නේ උපත අනුව නොව ඔහුගේ ක්‍රියාවන් මත බව බුදුරජාණන් වහන්සේ විසින් අනුදැන වදාළ දහමේ පොදු ආඛ්‍යානය වුයේය. ඒ ඔස්සේ සියල් මිනිස් වග එක රැහැනින් යා කෙරෙන සහජීවනය අනුප්‍රාණය ලද්දේය.

වෛරී සිත්මත මෛත්‍රීයේ පැන් ඉසිමින් සියලු සත්වග වෙත අපරිමිත කරුණා, මුදිතා, ගුණයෙන් මිනිසාගේ බුද්ධිමය ප්‍රඥාව අවදි කරමින් සසර විමුක්තිය පහදා දුන් බුදුරජාණන් වහන්සේගේ අනන්ත වූ ගුණ සමුදාය මෙනෙහි කෙරෙන මේ පින්බර වෙසක් සමයේ අනන්තවූ බුදුගුණ මහිමයේ අනුහසින් සකල ලෝ වැසි බොදුනුවනට උතුම් වූ වෛශාඛ්‍ය මංගල්‍යයක් වේවා යි පතමි.

මෛත්‍රීපාල සිරිසේන

2018 අප්‍රේල් මස 29 වන දින

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு

Democratic Socialist Republic of Sri Lanka